පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.26 පැය 0015 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1069/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අභාවප්‍රාප්ත වූ මාලනී ෆොන්සේකා මහත්මියගේ අවමඟුල් උත්සවය වෙනුවෙන් නිදහස් චතුරශ්‍රය අවට ප්‍රදේශයේ රථවාහන ගමනාගමනය සීමා කිරීම.**

අභාවප්‍රාප්ත වූ මාලනී ෆොන්සේකා මහත්මියගේ අවමඟුල් උත්සවය රාජ්‍ය අනුග්‍රහය යටතේ 2025.05.26 වන දින පස්වරු 0400 සිට පස්වරු 0600 දක්වා පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

අවමංගල්‍ය උත්සවය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත රථවාහන සැලැස්ම පහත පරිදි වේ.

**අවමංගල්‍ය පෙරහැර ගමන් කරන මාගර්ය -**

පෙරවරු 0730 ට බෞද්ධාලෝක මාවතේ ජාවත්ත හන්දියෙන් ආරම්භ වී බොරැල්ල දෙසට ගමන් කර මේඩ්ලන්ඩ් පෙදෙස හන්දියෙන් වමට හැරී මේඩ්ලන්ඩ් පෙදෙස මාගර්ය ඔස්සේ ගමන් කර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ හන්දියෙන් වමට හැරී නිදහස් මාවත ඔස්සේ ගමන් කර පෙරවරු 0900 ට නිදහස් චතුරශ්‍රය වෙත පැමිණීමට නියමිතය.

**රථවාහන ගමනාගමනය සිදුකරන ආකාරය -**

මෙම අවමංගල්‍ය පෙරහැර හා උත්සවය වෙනුවෙන් මාගර් වසා තැබීමක් සිදු නොකරන අතර අවමංගල්‍ය පෙරහැර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ හන්දියේ සිට නිදහස් මාවත ඔස්සේ නිදහස් චතුරශ්‍රය දක්වා ගමන් කිරීමේදී විනාඩි 15 ක කාලයක් සඳහා නිදහස් වටරවුම සිට නිදහස් මාවතට ඇතුළු වන රථවාහන සීමා කරනු ලබයි.

අවමංගල්‍ය උත්සවය පැවැත්වෙන අවස්ථාවේ ඒ අවට පිහිටා ඇති නිදහස් මාවත සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඉදිරියෙන් දිවෙන ප්‍රේමකීතර්ි ද අල්විස් මාවත යන මාගර්යන්හි අවහිරතාවයක් ඇති වීමට ඉඩ ඇති බැවින් විකල්ප මාගර් භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවට දැනුම් දෙනු ලබයි.

**විකල්ප මාගර් -**

නිදහස් වටරවුමේ සිට බෞද්ධාලෝක මාවතට ගමන් කරනු ලබන රථවාහන නිදහස් වටරවුමේ සිට තුම්මුල්ල හන්දිය දෙසට දිවෙන පිලිප් ගුණවධර්න මාවත ඔස්සේ ගොස් රාජකීය විද්‍යාලය අසලින් වමට හැරී ගමන් කරනු ලබන මහාචායර් ස්ටැන්ලි විජේසුන්දර මාවත ඔස්සේ ගමන් කර බෞද්ධාලෝක මාවතට පිවිසිය හැකිය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**